සියලුම හිමිකම් ඇවිරිණි
KOg; gjpg;GupikAilaJ
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / njd; khfhzf; Ry;tpj; jpizf;Rsk;

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

10 ශ්‍රේණිය | ව්‍යවසායකත්ව අධ්‍යයනය - 1 | කාලය පැය 1

නම / විභාග අංකය ..........................................................................................................

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලදී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් නොවන්නේ,

   1. අනාගත දැක්ම
   2. නම්‍යශීලීත්වය
   3. නවෝද්පාදනය
   4. අවදානම් භාර නොගැනීම

2. ප්‍රාග්ධනය නැමැති නිෂ්පාදන සාධකයට අයත් වන්නේ

   1. ශ්‍රමය
   3. යන්ත්‍රසූත්‍ර
   2. පස
   4. අමු ද්‍රව්‍ය

3. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධකයක් නොවන්නේ

   1. වැරදීම් හා විවේචන සඳහා ඇති බිය
   2. ප්‍රායෝගික වීමට බාධා ඇතැයි සිතීම
   3. විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
   4. යම් ගැටලුවකට විසඳුම් එකක් පමණක් ඇතැයි නොසිතීම

4. අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාවය දැක්වෙන ප්‍රකාශනය නම් කරන්න.

   1. අවදානම ඉහල නම් ප්‍රතිලාභය පහළ වේ
   2. අවදානම ඉහල නම් ප්‍රතිලාභය ඉහළ වේ
   3. අවදානම පහල නම් ප්‍රතිලාභය වෙනස් නොවේ
   4. අවදානම පහළ නම් ප්‍රතිලාභය ඉහල වේ

5. ව්‍යාපාරයක් යනුවෙන් අදහස් කරන්නේ

   1. භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතනයක්
   2. සේවා නිෂ්පාදනය කරන ආයතනයක්
   3. මිනිස් අවශ්‍යතා සපුරාලීමට භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතනයන්ය
   4. මිනිස් අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය බෙදාහැරීම හා සම්බන්ධ වූ සියලුම කටයුතුය.

6. අවශ්‍යතාවයක ලක්ෂණයක් නොවන්නේ

1. පොදු වීම
2. සීමිත වීම
3. සරල වීම
4. සංකීර්ණ වීම

7. අවශ්‍යතා පමණක් අතුළත් කාණ්ඩය වන්නේ

1. කිරිපිටි, ඇඳුම්, අධිවේගී මාර්ග, තට්ටු නිවාස
2. ආහාර, සාරි, පොත්පත්, සඟරා
3. ආහාර, ඇඳුම්, නිවාස, පාන්
4. ආහාර, අධ්‍යාපනය, නිවාස, ඇඳුම්

8. අවශ්‍යතා - වුවමනා දක්වෙන නිවැරදි පිළිතුරු වන්නේ

1. අධ්‍යාපන - පෞද්ගලික පන්ති
2. පාන් - ආහාර
3. ආරක්ෂාව - ප්‍රවාහනය
4. ආහාර - සෞඛ්‍ය

9. භාණ්ඩයක ඇති සුවිශේෂ ලක්ෂණයක් වන්නේ

1. භෞතික පැවැත්මක් නැත
2. ගබඩා කල නොහැක
3. සපයගන්නා ගෙන් වෙන් කල නොහැක
4. සමජාතිය බව ආරක්ෂා කල හැකිය

10. ව්‍යාපාරවල ගති ලක්ෂණයක් නොවන්නේ

1. අරමුණක් පැවතිම
2. ආර්ථික කටයුත්තක් විම
3. අවදානමක් පැවතිම
4. ගනුදෙනු අඛණ්ඩව සිදු නොවීම

11. කුඩා පරිමාණ ව්‍යාපාරයක් පිළිබඳව ඉදිරිපත් කර ඇති පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ

1. සාපේක්ෂව සේවක සංඛ්‍යාව අඩු නිසාවෙන් කුඩා පරිමාන ව්‍යාපාර සෑම විටම අඩු ගුණත්වයෙන් යුතු භාණ්ඩ හා සේවා නිපදවයි
2. සාපෙක්ෂව කුඩා ප්‍රාග්ධනයකින් ආරම්භ කලහැකි නිසා ලොව කිසිදු කුඩා පරිමාන ව්‍යාපාරයක් බැංකු ණය ලබා නොගනී
3. කුඩා පරිමාණ ව්‍යාපාර පවත්වාගෙන යාමේදි තීරණ ගැනිම සාපේක්ෂව පහසුය
4. කුඩා පරිමාණ ව්‍යාපාර මහා පරිමාන ව්‍යාපාර මෙන් ආර්ථිකයට වැදගත් නොවේ.

12. කුඩා පරිමාන ව්‍යාපාරවල දැකිය හැකි ශක්තියක් නොවන්නේ

1. කුඩා ප්‍රාග්ධනයකින් ආරම්භ කලහැකි විම
2. ව්‍යාපාර කටයුතු සඳහා දේශීය තාක්ෂණය භාවිතා කලහැකිවිම
3. ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශයකට සීමාවිම
4. වෙනස්වන පරිසරයට ඉක්මනින් ප්‍රතිචාර දක්විය හැකි විම

13. විශාල හා අසාමාන්‍ය සිරුරක් හිමි පුෂ්පරාජ මහතා ඔහුට ගැලපෙන කමිසයක් මිලදී ගැනිම සඳහා

නගරයේ පිහිටි මහා පරිමාණ නිමි ඇඳුම් වෙළෙඳසැල් සියල්ලටම ගියත් ඔහුගේ වුවමනාව ඉටුනොවූ නිසා අසතුටට පත්විය. මෙම සිද්ධියෙන් පැහැදිලි වන්නේ

1. පුෂ්පරාජ මහතා අවාසනාවන්ත පාරිභෝගිකයෙකු බවයි
2. නගරයේ වෙළඳසැල් පාරිභෝගික අවශ්‍යතා ඉටු නොකරන බවයි
3. නිමි ඇඳුම් වෙළඳපල තුල වෙළඳපල හිදැසක් ඇති බවයි
4. මහා පරිමාන ව්‍යාපාර පුෂ්පරාජ මහතා වැනි අය සඳහා ගැලපෙන ඇඳුම් කෙසේ හෝ අලෙවි කලයුතු බවයි.

14. කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතුවක් නොවන්නේ
    1. ව්‍යාපාරයේ මුදල් ගණුදෙනු කිසිඳු පාලනයකින් තොරව පවත්වා ගෙනයාම
    2. ව්‍යාපාරිකයා සෑම විටම ව්‍යවසායකු ලෙස කටයුතු කිරීම
    3. ආනයනික අඩු මිල නිෂ්පාදන සමග තරග කිරීම අපහසු බව
    4. දැනුම හා අත්දැකීම් අඩු ක්ෂේත්‍රයක ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම

15. පහත වගුවේ දැක්වෙන්නේ කුඩා පරිමාණ රසකැවිලි නිශ්පාදකයෙකු වූ සමන් සිය ව්‍යාපාරය තුල ඉටු කල කාර්යන් කිහිපයක් හා ඒවාට අදාල යැයි ඔහු සිතන ව්‍යවසායකත්ව භූමිකාවන්ය.

| | කාර්යය | භූමිකාව |
|---|---|---|
| A | නව උඳුනක් මිලදීගැනීම සඳහා රු. 10000ක් යෙදවීම | අයිතිකරු |
| B | රසකැවිලි නිපදවීමේදී සමන් සේවකයන්ගේ නව අදහස් වලට සවන් දේ | කළමනාකරු |
| C | සෑම වසරක්ම අවසානයේදී සමන් ඉලක්ක රසකැවිලි අලෙවිය හා සත්‍ය අලෙවිය සසඳා බලයි | කළමනාකරු |
| D | සමන් සෑම ව්‍යාපාර කටයුත්තක්ම මනාව සංවිධානය කරයි | නායකයා |

ඉහත කරුණු අතරින් කාර්‍ය්‍ය හා භූමිකාව නිවැරදිව ගලපා ඇති අක්ෂර පමණක් දක්වන්න

1. A හා C පමණි
2. A B හා C පමණි
3. A පමණි
4. A B C හා D යන සියල්ලම නිවැරදි වේ.

16. කුඩා පරිමාණ පරිඝනක වැඩසටහන් නිශ්පාදකයෙකු වූ චමිර කොරෝනා වසංගත සමයේදී අධ්‍යාපනයට උපකාරී නව ඉගෙනුම් මෘදුකාංගයක් ගුරුවරුන් වෙනුවෙන් හඳුන්වාදෙන ලද අතර එය ප්‍රදේශයේ ගණිත ගුරුවරුන් අතර ඉතා ප්‍රචලිත විය. මේ තුල ප්‍රකට වන චමිර සතු ව්‍යවසායකත්ව කුසලතාවය වන්නේ
    1. තාක්ෂණික කුසලතාවය
    2. මානව කුසලතාවය
    3. කණ්ඩායම් කුසලතාවය
    4. සංකල්පනාත්මක කුසලතාවය

17. ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව ශ්‍රී ලංකාවේ දල දේශීය නිශ්පාදනයට 52% පමණ දායකත්වයක් සපයන්නේ කුඩා හා මධ්‍යම ව්‍යාපාරයි. මින් පැහැදිලි වන්නේ
    1. රටක සියලු ව්‍යාපාර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විය යුතු බවයි.
    2. මහා පරිමාණ ව්‍යාපාර ආර්ථික වර්ධනයට වැදගත් නොවන බවයි.
    3. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශ්‍රී ලංකා ආර්ථිකයේ කොඳු නාරටිය වන බවයි.
    4. ශ්‍රී ලංකාවේ මහා පරිමාණ ව්‍යාපාර දිනෙන් දින වැසීයෑමේ තර්ජනයට මුහුන පා ඇති බවයි.

18. අනෝමා කුඩා පරිමාන ඇගලුම් කම්හලක හිමිකාරියයි. කම්හල සඳහා නවක සේවිකාවන් 10 දෙනෙකු බඳවා ගැනීම සඳහා ඇය විසින් මෑතකදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ අතර එහිදී සැබැවින්ම ආදුම් මැසිය හැකි 10 දෙනෙකු විධිමත් පටිපාටියකට අනුව බඳවා ගැනිමට ඇය සමත්විය කෙසේ නමුත් බඳවාගත් සේවිකාවන් සහ අනෝමා අතර නිරන්තරයෙන් ඇති වූ ගැටුම් නිෂ්පාදන ක්‍රියාවලියට දැඩි බාධාවක් විය.

ඉහත සිද්ධියට අනුව අනෝමා විසින් වැඩි දියුණු කරගත යුතු කුසලතාවය හා ඇයගේ චරිතය තුල කැපී පෙනෙන කුසලතාවය පිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

1. සංකල්පනාත්මක කුසලතාවය, තාක්ෂණික කුසලතාවය

2. තාක්ෂණික කුසලතාවය, මානව කුසලතාවය

3. මානව කුසලතාවය, තාක්ෂණික කුසලතාවය

4. තාක්ෂණික කුසලතාවය, උපදේශන කුසලතාවය

19. ව්‍යවසායකත්ව භූමිකාවන්ගේ සාර්ථකත්වය උදෙසා ව්‍යවසායයෙකු විසින් වර්ධනය කරගතයුතු මූලික කුසලතාවයක් නොවන්නේ

1. සංකල්පනාත්මක කුසලතාවය
2. මානව කුසලතාවය
3. නිර්මාණශීලි කුසලතාවය
4. තාක්ෂණික කුසලතාවය

20. ව්‍යාපාර කටයුතු පිළිබඳ තොරතුරු විධිමත්ව රැස් කිරීමට හා ඒවා අදාල පාර්ශව වෙතට ලබාදීම සඳහා ව්‍යවසායයකයෙකු දක්වන සුවිශේෂී හැකියාව

1. සන්නිවේදන කුසලතාවයයි
2. තොරතුරු තාක්ෂණ කුසලතාවයයි
3. උපදේශන කුසලතාවයයි
4. තාක්ෂණික කුසලතාවයයි

21. අතීත ව්‍යාපාර පරිසරයට වඩා නූතන ව්‍යාපාර පරිසරයේ දැකිය හැකි වෙනස්කම් පෙන්වන කාණ්ඩය වනුයේ

1. තරගය වැඩිය / ව්‍යාපාරිකයා බලවත්ය / වුවමනාව සරලය / ගෝලීයව ව්‍යාප්තව ඇත

2. තරගය වැඩිය / පාරිභෝගිකයා බලවත්ය / වුවමනා සරලය / ගෝලීයව ව්‍යාප්තව ඇත

3. පාරිභෝගිකයා බලවත්ය / තරගය වැඩිය / වුවමනා සංකීර්ණය / ගෝලීයව ව්‍යාප්තව ඇත

4. පාරිභෝගිකයා බලවත්ය / වුවමනා සංකීර්ණය / ලාභය ප්‍රධාන අරමුණ වේ / ගෝලීයව ව්‍යාප්තව ඇත

22. ව්‍යවසායකයෙකුට ව්‍යාපාර පරිසර විශ්ලේෂණයකින් ලබාගත හැකි ප්‍රයෝජන වන්නේ

1. පුහුණු සේවකයින් ව්‍යාපාරයට ආකර්ශණය කරගත හැකිය

2. ව්‍යාපාරයක කලමනාකරන කටයුතු පහසුවෙන් සිදුකරගත හැකිය

3. පාරිභෝගිකයන් ව්‍යාපාරයට ආකර්ශණය කරගත හැකිය

4. පරිසර වෙනස්කම් වලට ගැලපෙන පරිදි සැලසුම් සකස් කිරීම හා උපාය මාර්ග තීරණය කල හැකිය

23. ව්‍යාපාරයක අභ්‍යන්තර පාරිසරික සාධකයක් වන්නේ

1. තරගකරුවන්
2. පාරිභෝගිකයන්
3. රජය
4. කලමනාකරුවන්

24. ව්‍යවසායකයෙකු සිය ව්‍යාපාරය සඳහා ශක්තීන් හඳුනා ගැනීමට විශ්ලේෂණය කරනුයේ

1. ගෝලිය පරිසරය
2. අභ්‍යන්තර පරිසරය
3. තාක්ෂණික පරිසරය
4. ආසන්න පරිසරය

25. ව්‍යාපාරයක ආසන්න පරිසර සාධකයක් වනුයේ

1. පාරිභෝගිකයන් 2. අයිතිකරුවන්

3. රජය 4. කලමනාකරුවන්

26. රජය විසින් තේ වගාව සඳහා සැපයූ පොහොර සහනාධාරය ඉවත් කිරීම 'තේ වගා හිමියන්ට තර්ජනයකි.' මෙය හඳුනාගත හැකි පරිසරය වනුයේ

1. ආර්ථික පරිසර 2. දේශපාලන හා නෛතික පරිසරය

3. ගෝලීය පරිසරය 4. සංස්කෘතික පරිසරය

27. පහත ප්‍රකාශ අතරින් ව්‍යාපාර ශක්තියක් නොවන්නේ

1. ගුණාත්මක නිශ්පාදන සාධාරණ මිලකට ලබාදීම

2. සම්පත් අර පිරිමැස්මෙන් භාවිතා කිරීම

3. ව්‍යාපාරය නව උපකරණ භාවිතා කිරීම

4. නම්‍යශීලී සැලැස්මක් ආයතනයේ නොතිබීම

28. ප්‍රජා පරිසර අධ්‍යාපනයෙන් හඳුනාගත හැකි සාධකය

1. ආදායම් වෙනස් වීම 2. උද්ධමනය

3. පාරිභෝගික ආකල්ප 4. තාක්ෂණය වෙනස්වීම

29. ව්‍යාපාර පරිසර සාධක අතුරින් ව්‍යාපාරයකට පාලනය කල නොහැකි සාධකය වනුයේ

1. ප්‍රජාව 2. කලමනාකරුවන්

3. සේවකයින් 4. අයිතිකරුවන්

30. අතීත ව්‍යාපාර පරිසරය තුල දකින්නට ලැබුණු ලක්ෂණයකි

1. පාරිභෝගිකයා බලවත්ය 2. ව්‍යාපාරිකයා බලවත්ය

3. උවමනා සංකීර්ණය 4. තරගකාරීත්වය වැඩිය

31. ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාමේදී ව්‍යාපාරිකයන්ට විවිධ භූමිකා වලට මුහුන දීමට සිදුවේ පහත සඳහන් කාර්යන් අතුරින් එවැනි කාර්යන් නොවන්නේ

1. මිලදී ගැනිමේ කටයුතු

2. නිශ්පාදන කටයුතු

3. නෛතික අවශ්‍යතා ඉටු කිරීම

4. නවෝත්පාදන බිහි කිරීම

32. ඉලක්ක ගත පාරිභෝගිකයන් යනුවෙන් අදහස් කරන්නේ

1. දැනටමත් වෙළඳපලේ සිටින සියලුම පාරිභෝගිකයන්ය

2. වෙළඳපලට පිවිසීමට බලාපොරොත්තුවෙන් සිටින පාරිභෝගිකයන්ය

3. දැනටමත් නිශ්පාදිත පරිභෝජනය කරන පිරිස හා අනාගතයේ පරිභෝජනය කිරීමට ඉඩ ඇති පාරිභෝගික කොටසයි

4. වෙළඳපලෙන් ඉවත් වීමට බලාපොරොත්තුවෙන් සිටින කොටසයි

33. ව්‍යාපාර සාර්ථක වීම සඳහා බලපාන ප්‍රධාන සාධකයක් වන්නේ පිහිටුවන ස්ථානයයි. ඒ අනුව ව්‍යාපාර ස්ථානගත කිරීමේදී අවධානය යොමු කරන ප්‍රධාන සාධකයක් වන්නේ

1. ව්‍යාපාරයේ අනාගත දියුණුව හා ප්‍රතිආයෝජනය පිළිබඳ
2. ගනුදෙනුකරුවන් ප්‍රමාණය සහ ඔවුන්ගේ විසිරීම පිළිබඳ
3. ව්‍යාපාරයේ පදනම් වන භාණ්ඩය හෝ සේවාව කුමක්ද යන්න
4. ව්‍යාපාරය තුලින් සමාජයට කවර ප්‍රතිලාභ අත්කර දිය හැකිද යන්න.

34. නව නිශ්පාදනයක් වෙළඳපලට ඉදිරිපත් කිරීම සඳහා ව්‍යවසායකයෙකු විවිධ ක්‍රම භාවිතා කරනු ලැබේ. එවැනි නිෂ්පාදන නව්‍යකරනයට මඟ පෙන්වන සාධකයක් නොවන්නේ

1. යළි සකස් කිරීම
2. කුඩා කිරීම
3. අදේශ කිරීම
4. මිල පහළ දැමීම

35. නිෂ්පාදිත ප්‍රභේදය යනු

1. නිෂ්පාදිතයට යම් යම් වෙනස්කම් සිදු කිරීම
2. නිශ්පාදිතයේ මිල වැඩි කිරීම
3. නිශ්පාදිතයේ ගුණත්වය වෙනස් කිරීම
4. නිශ්පාදිතයේ දැවටුම වෙනස් කිරීම

36. නව ව්‍යාපාරයක් සඳහා සාර්ථක පිවිසුම් උපාය මාර්ගයක් නොවන්නේ

1. නිෂ්පාදිත ප්‍රභේදනය
2. නවෝද්පාදනය
3. වෙළඳපල හිඩැස / අවකාශය
4. විකුණුම් ප්‍රවර්ධනය

37. හොඳ ව්‍යාපාර අදහසක ලක්ෂණයක් වන්නේ

1. පරිසරයේ මතුවන අවශ්‍යතා සපුරාලියහැකි වීම
2. මුහුන දෙන අවධානම අවම කරගත නොහැකිවීම
3. තරගකාරීත්වයට සාර්ථකව මුහුන දිය නොහැකි වීම
4. වෙනස්වන තාක්ෂණය සමඟ හැඩ ගැසීමට නොහැකි වීම

38. හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්ෂණයක් නොවන්නේ

1. ඉල්ලුමක් පැවතීම
2. තරඟකාරීත්වයට මුහුණ දිය හැකි වීම
3. අවශ්‍ය සම්පත් සපයාගත හැකිවීම
4. ආකර්ෂණීය ඉපයුමක් නොමැති වීම

39. සූක්ෂම විශ්ලේෂණය සඳහා භාවිතා කලහැකි නිර්ණයක් වන්නේ

1. රජයේ නීතිරීති ප්‍රතිපත්ති හා දිරිගැන්වීම
2. නිශ්පාදන අලෙවි කිරිමේ හැකියාව
3. තරඟකාරීත්වය
4. ව්‍යවසායකත්ව ලැදියා හා හැකියා

40. ව්‍යවසායකයෙකු සම්බන්ධයෙන් බලපෑහැකි ශක්තියක් නොවන්නේ

1. දක්ෂ සේවකයන් සිටීම
2. මුල්‍ය ස්ථාවරත්වය
3. නව තාක්ෂණය පැවැතීම
4. අමු ද්‍රව්‍ය හිගය

සියලුම හිමිකම් ඇවිරිණි
KOg; gjpg;GupikAilaJ
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** தென் khfhzf; Ry;tpj; jpizf;Rsk;

**DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE**

**අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)**

10 ශ්‍රේණිය | **ව්‍යවසායකත්ව අධ්‍යයනය II** | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:...........................................................................................................

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා 1 සිට 10 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

දකුණු පළාතේ කුඩා තේවතු හිමියෙකු වන සම්පත් මහතා හොඳ ව්‍යවසායෙකු වීමට සිහින මවන්නෙකි. ලොව පුරා සිටින සාර්ථක ව්‍යවසායකයින් පිළිබඳව අධ්‍යයනය කිරීම හා ඔවුන්ගේ තොරතුරු එක් රැස් කිරීම ඔහු කලක සිට සිදු කරයි. ගාල්ල කාර්මික විද්‍යාලයෙන් ලබාගත් යන්ත්‍ර ක්‍රියාත්මක කරවීමේ පුහුණුවත් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ හැදෑරූ ව්‍යවසායකත්වය පාඨමාලාවත් ඔහු ගේ සිහිනයට රුකුලක්ව ඇත.

මේ වනවිට තේ වෙළඳපොල පාරිභෝගිකයන්ගෙන් රසවත්, ගුණාත්මයෙන් ඉහළ තේකොල සඳහා ඉල්ලුමක් පවතින බවත් එය එහි ලංකාව පුරාම පවතින බවත් ඔහු සපයාගත් තොරතුරු මගින් අවබෝධ කරගෙන ඇත. එම නිසා තම තේ ඉඩමෙන් ලැබෙන තේදළු ඇස්වැන්න අමු ද්‍රව්‍ය ලෙස යොදාගෙන තේ පානය කරන්නන් හට ගුණත්වයෙන් ඉහල මිලෙන් අඩු (High quality law price) තේ කොළ නිෂ්පාදනයට ඔහු දැනටමත් සැලසුම් සකස් කොට ඇත. ඉතා කුඩාවට තම නිවසේදීම (Home Made) ආරම්භ කොට මහා පරිමාණ ව්‍යවසායෙකු වීම ඔහු ගේ අරමුණයි. මේ සඳහා කටුබැද්ද කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් පවත්වන ඇසුරුම්කරණය හා තත්වාරක්ෂණය පාඨමාලාවක්ද ඔහු හදාරා ඇත.

දේශීය පාරිභෝගිකයන් මෙන්ම තම ප්‍රදේශයේ ආගමික හා ස්වභාවික ස්ථාන නැරඹීමට පැමිණෙන විදේශිකයන්ද ඔහු ගේ ඉලක්ක පාරිභෝගිකයන් වේ. තේ කොළ නිෂ්පාදනයට අවශ්‍ය යන්ත්‍ර සොයා ගැනීමට ඔහු මේ වන විටත් පියවර ලෙන ඇති නමුත් එය තරමක දුෂ්කරය. තමා ඉතිරිකරගත් මුදල් මෙම නිෂ්පාදනයට ආයෝජනය කිරීමට සම්පත් අපෙක්ෂා කරයි. තේ කර්මාන්තශාලාවන්හි තේ නිෂ්පාදක වරයෙකු ලෙස කටයුතු කරන ඔහුගේ සහෝදරයින්ගේ සහායද ඔහුට ලැබෙමින් පවතී.

කෙසේ නමුත් රජයෙන් කුඩා ව්‍යවසායකයින්ට මුල්‍ය හා මුල්‍ය නොවන දිරිගැන්වීම් ප්‍රමානවත් පරිදි නොතිබීම ශෝචනීය තත්වයකි. මෙම අභියෝගය හමුවේ ඔහු ගේ සිහිනය සැබෑකර ගැනීමට වෙරදරමින් සිටින සම්පත් මහතා ව්‍යාපාර සැලසුම් (Business plan) සකස් කරමින් තේ කොළ නිෂ්පාදනයට පියවරක් තබා ඇත.

01. සම්පත් ගේ නිර්මාණශීලිත්වය වර්ධනය කර ගැනීමට හේතු වී ඇති මෙම සිද්ධියෙන් මතුවන කරුණු 02 ක් දක්වන්න (02)

02. සම්පත් මහතා සපයනුයේ තේ පානය නැමැති වුවමනාවයි මේ සඳහා තවත් ආදේශකයන් 02 ක් දෙන්න (02)

03. ඕනෑම නිෂ්පාදනයකට අවශ්‍ය වන නිශ්පාදන සාධක 4ක් නම් කරන්න. (02)

04. "රැකියා නියුක්තිකයෙකු වීමට වඩා ව්‍යවසායකයෙකු වීම වඩාත් ප්‍රතිලාභ ගෙන දේ" මෙම ප්‍රකාශයට ඔබ එකඟද / එකඟනොවේද හේතු 02ක් දක්වන්න. (02)

05. ඔහු හඳුනාගත් "වෙළඳපල හිඩැස" කුමක්ද? (02)

06. මෙම ව්‍යවසායකයාට වෙළඳපලට ප්‍රවේශ වියහැකි විකල්ප අවස්ථා අතුරින් හොඳම විකල්ප අවස්ථාව දක්වන්න. (02)

07. වෙළඳපොලෙහි පවතින දැඩි තරඟය හමුවේ උචිත උපාය මාර්ග අනුගමනය කිරීමට ඔහුට සිදුවේ. මෙහිදී ඔහුට යොදාගත හැකි උචිත උපාය මාර්ගයන් දක්වන්න. (02)

08. ව්‍යපාර අදහස් ගනනාවක් අධ්‍යයනය කල සම්පත් අවසානයේදී සුදුසු ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගෙන ඇත. අප ගේ විෂයට අදාලව එය පුනීල ආකෘතියෙන් පෙන්නුම් කරන්න. (02)

09. ශදු අත විශ්ලේෂනය මෙම සිද්ධියට යොදාගනිමින් නිදසුන් සපයන්න. (02)

10. නීතිමය රැකවරණය සඳහා නව සොයා ගැනීමකට රජයෙන් ලබාගත යුතු බලපත්‍රය කුමක්ද? එහි වලංගු කාලය කුමක්ද? (02)

(2x10)

02. 2023 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ පාසැල් වල ව්‍යවසායකත්ව අධ්‍යයනය විෂය 6 වසරේ සිට ආරම්භ කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය තීරණය කර ඇත.

1. ව්‍යවසායකත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (02)

2. භාණ්ඩ හා සේවා නිපදවීම සඳහා සම්පත් අවශ්‍ය වේ. මෙම සම්පත් ප්‍රධාන වශයෙන් නිශ්පාදන සාධක යනුවෙන් වර්ග 4කට වෙන්කර ඇත. එම නිෂ්පාදන සාධක 4 නම් කරන්න. (02)

3. නිර්මාණශිලිත්වය යනු කුමක්දැයි හදුන්වා එය බාධා වියහැකි සාධක 02 ක් නම්කරන්න. (02)

4. නිර්මාණශිලිත්වය වර්ධනය කරගත හැකි ආකාර 04 ක් සඳහන් කරන්න. (02)

5. නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍ර 02 නම් කරන්න. (02)

2x5

03. 1. අවශ්‍යතා හා වුවමනා හඳුන්වා අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් 02 ක් දක්වන්න. (02)

2. භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් 02ක් දක්වන්න. (02)

3. ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා සන්සන්දනය කරන්න. (02)

4. ව්‍යවසායකයන් වර්ග 02 ක් දක්වා උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (02)

5. ව්‍යාපාර වල ගති ලක්‍ෂණ 04 ක් ලියන්න. (02)

04. 1. ව්‍යවසායකයන්ගෙන් දේශීය ආර්ථිකයට හිමිවන ප්‍රතිලාභ 04 ක් නම් කරන්න.

2. කුඩා පරිමාණ ව්‍යාපාරයක් යනු කුමක්දැයි හඳුන්වා කුඩා පරිමාණ ව්‍යාපාරයක ලක්‍ෂණ 02 ක් දක්වන්න.

3. මහා පරිමාණ ව්‍යාපාර වලට සාපෙක්‍ෂව කුඩා පරිමාණ ව්‍යාපාර වල පවතින ශක්තීන් 04 ක් නම් කරන්න.

4. දිනෙන් දින අසාර්ථක වෙමින් පවතින කුඩා පරිමාණ ව්‍යාපාරයක ඒ තත්වයට බලපා ඇතැයි ඔබ සිතන හේතු 02 ක් හා ඒවා නිවැරදි කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග 02 ක් ලියා දක්වන්න.

5. කුඩා පරිමාණ ව්‍යාපාර හා ව්‍යවසායකත්වය අතර සබඳතාවය කරුණු 02 ක් ඇසුරින් පැහැදිලි කරන්න.

(2x5)

05. 1. ව්‍යාපාර පරිසරය වර්ග කොට ගැලිම් සටහනක් මගින් දක්වන්න. (02)

2. ලාභය අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයක් වන "රජයේ පාසල" නිදසුන් ලෙස ගෙන ශක්තියක්, දුර්වලතාවයක්, අවස්ථාවක්, තර්ජනයක් ඉදිරිපත් කරන්න. (02)

3. ව්‍යවසායකයෙකුට දේශපාලන හා නෛතික පරිසරයක් විශ්ලේෂණය කිරීමෙන් ලබාගත හැකි සාධක 02ක් දක්වන්න. (02)

4. ව්‍යාපාර පරිසරයක් තුල ව්‍යවසායකයෙකුට පාලනය කල හැකි පාලනය කල නොහැකි සාධක 02ක් බැගින් දක්වන්න. (02)

5. ශුද්‍ධත විශ්ලේෂණය ව්‍යාපාර පරිසරය හා සම්බන්ධ වන ආකාරය දක්වන්න. (02)

06 ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී මුදල්, සම්පත්, කාලය, ශ්‍රමය හා ප්‍රතිරූපය වැනි දෑ යෙදවීමට සිදු වේ. මෙසේ ආරම්භ කරන ව්‍යාපාර සාර්ථක කරගැනීම සඳහා සැලකිල්ලට ගතයුතු තීරණ කිහිපයකි.

1. එසේ ව්‍යාපාර සාර්ථක කරගැනීම සඳහා සැලකිල්ලට ගත යුතු තීරණ 4 ක් නම් කරන්න.

2. සුළු පරිමාණ ව්‍යවසායකයෙකුට අති ප්‍රාග්ධන සම්පාදන මාර්ග 4 ක් නම් කරන්නත

3. නව ව්‍යවසායකයෙකුට වෙළඳපලට ප්‍රවේශ වීම සඳහා අනුගමනය කලහැකි විකල්ප ක්‍රම 4ක් දක්වන්න.

4. ව්‍යාපාරයක් ආරම්භ කරන්නෙකු තම නිශ්පාදිතයන් වෙත පාරිභෝගිකයන් ආරාක්ෂා කරගැනීම සඳහා අනුගමනය කල යුතු උපාය මාර්ග 4 ක් නම් කරන්න.

5. වෙළඳපොල හිඩැස යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

(2x5)

07. ව්‍යාපාර ලොකයේ දකින්නට ඇති සියලුම භාණ්ඩ සේවා ක්‍රියාවලිය හා ක්‍රමශිල්ප වයාපාර අදහස් වල ප්‍රතිඵලයන්ය

1. හොඳ ව්‍යාපාර අදහසක ලක්‍ෂණ 4 ක් නම් කරන්න.

2. ව්‍යාපාර අදහස් මුලාශ්‍ර 4 ක් නම් කරන්න.

3. හොඳ ව්‍යාපාර අවස්ථාවක ලක්‍ෂණ 4 ක් නම් කරන්න.

4. සූක්‍ෂම විශ්ලේෂනය සඳහා භාවිතා කලහැකි නිර්නායක 4 ක් දක්වන්න.

5. ව්‍යාපාරිකයෙකුට තම නිර්මාණාත්මක ව්‍යාපාර අදහස් ආරක්‍ෂා කරගැනීමට ගතයුතු ක්‍රියා මාර්ගය කුමක්ද?

06. ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදි මුදල් සම්පත් කාලය ශ්‍රමය හා ප්‍රතිරූපය වැනි දෑ යෙදවීමට සිදුවේ. මෙසේ

# 10 ශ්‍රේණිය - ව්‍යවසායකත්ව අධ්‍යයනය - 2021

## පිළිතුරු පත්‍රය - I කොටස

(1). 4 (2). 3 (3). 4 (4). 2 (5). 4 (6). 4 (7). 4 (8). 1 (9). 4 (10). 4 (11). 3 (12). 3 (13). 3 (14). 2 (15). 1 (16). 4
(17). 3 (18). 3 (19). 3 (20). 1 (21). 3 (22). 4 (23). 4 (24). 2 (25). 1 (26). 2 (27). 4 (28). 3 (29). 1 (30). 2 (31). 4 (32). 3
(33). 2 (34). 4 (35). 1 (36). 4 (37). 1 (38). 4 (39). 1 (40). 4

## පිළිතුරු පත්‍රය - II කොටස

01 1. - විවිධත්වය ග්‍රහණය කර ගැනීම
- ගැටලු අභියෝග ලෙස භාර ගැනීම
- නිර්මාණශීලි පුහුණු අවස්ථා
- නිර්මාණාත්මක හැසිරීම් අනුකරණය කිරීම

2. කෝපි, කිරිපිටි, යෝගට්පානය, fresh milk, දේශීය බෙහෙත් වර්ග

3. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

4. එකඟ වේ.
ව්‍යවසායකත්වයේ ප්‍රතිලාභ දක්වා ඇත්නම් ලකුණු දෙන්න.

5. රසයෙන් ගුණයෙන් යුතු තේ කොළ සඳහා වෙළඳපලෙහි ඉල්ලුමක් පවතීම.

6. නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට

7. නිෂ්පාදික ප්‍රභේදනය / වෙළඳපල හිඩැස දූන භාණ්ඩ ඉදිරිපත් කිරීම.

8. ව්‍යාපාර අදහස් → සාරව විශ්ලේෂණය → සූක්ෂම විශ්ලේෂණය
→ ශුද්‍ධ අත විශ්ලේෂණය → යෝග්‍ය ව්‍යාපාර අවස්ථාව

(මෙම අදහස් දැක්වෙන පිරිදි පිළිතුර සැකසීමට ලකුණු ලබා දෙන්නත

9. <u>ශක්තීන්</u>
- කාර්මික විශ්ව විද්‍යාලයේ පුහුණුව
- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාඨමාලා
- අමු ද්‍රව්‍ය තමා සතුවිය
- කර්මික සංවර්ධන මණ්ඩලයේ පාඨමාලා
- සහෝදරයින් ගේ සහාය

<u>දුර්වලතා</u> - යන්ත්‍ර සොයා ගැනීමේ දුර්වලතා

<u>අවස්ථා</u> - වෙළඳපල හිදස - පාරිභෝගිකයන්ගේ ආකර්ශනය
- පුහුණු පාඨමාලා පැවතීම

<u>තර්ජන</u> - රජයේ දිරිගැන්වීම් නොමැති වීම - තරඟකරුවන් විශාල ප්‍රමාණයක් සිටීමම්

10. පේටන්ට් බලපත්‍රය = අවුරුදු 20

02. 1. ව්‍යවසායකත්වය යනු පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන අවදානම් දරමින් නිර්මාණශීලිත්නව තුලින් නවොත්පාදනය බිහි කිරීමට යොදන මිනිස් චින්තනය හා සම්බන්ධ වූ ක්‍රියාවලියකි. (ල.02)

2. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය ව්‍යවසාය $(\frac{1}{2} \times 4)$

3. ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව නිර්මාණශීලිත්වයති. (ල.01)
- විශ්වාස හා ආකල්ප කෙරෙහි තදබල ලෙස ගැලී සිටීම
- යම් විසඳුමකට එකම ගැටලුවක් ඇතැයි සිතිම
- වැරදීම් මහ විවේචන සඳහා ඇති බිය
- ක්ෂණික ප්‍රතිඵල අපෙක්ෂා කිරීම

4. - විවිධත්වය ග්‍රහණය කර ගැනීම - අසාර්ථකත්ව ඉවසීම
- නිර්මාණශීලි පුහුණු අවස්ථා - ගැටලු අභියෝග ලෙස දැකීම
- නිර්මානාත්මක හැසිරීම් ප්‍රදර්ශනය

5. - නව සොයා ගැනීමක් - දිගුවක්
- අනුකරණය කිරීමක් - සංකලනයක්

03. 1. මිනිසාගේ ජීවිතය පවත්වා ගෙන යාමට අනිවාර්යෙන්ම සපුරා ගත යුතු ද අවශතා ලෙස ලෙස සැලකේ. මිනිසාගේ අවශ්‍යතා සපුරා ගැනීමේ විවිධ ස්වරූප වුවමනා ලෙස හැඳින්වේ (ල.01)

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| මූලිකව පැන නගී | අවශ්‍යතා මතු වූ පසු දෙවනුව පැන නගී |
| සීමිතයි | අසීමිතයි |
| පොදු | පෞද්ගලික වේ |
| සරල | සංකීර්ණ වේ |

(ල.01)

2.

| භාණ්ඩ | සේවා |
|---|---|
| 1. භෞතික පැවැත්මක් ඇත | භෞතික පැවැත්මක් නැත |
| 2. ගබඩා කල හැකිය | ගබඩා කල නොහැකිය |
| 3. සපයන්නාගෙන් වෙන්කල හැකිය | සපයන්නාගෙන් වෙන්කල නොහැකිය |
| 4. පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය නොවේ | පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසකි |
| 5. සපයන්නාගෙන් වෙන්කල හැක | සපයන්නාගෙන් වෙන්කල වෙන්කල නොහැක |

3. සාමානකම්

- ආර්ථික කටයුත්තක යෙදීම
- අවධානමට මුහුව දීම
- ගනුදෙනුවල නිරත වීම
- සම්පත් භාවිතා කිරීම
- නිෂ්පාදනය, මිලදී ගැනීම හා විකිණීම සම්බන්ධ තීරණ ගැනීම
- තරඟයට මුහුන දීම
- පැවැත්ම ගැන සිතීම
- ස්වයං පෙළඹවීමක් තිබීම

| ව්‍යාපාරිකයා | ව්‍යවසායකයා |
|---|---|
| - සම්ප්‍රදායික ක්‍රම අනුගමනය කරයි | - නිර්මාණශීලි නවෝත්පාදන ක්‍රම අනුගමනය කරයි |
| - අවදානම් භාරගැනීමට කැමති නැත | - අවදානම් භාරගැනීමට කැමතිය |
| - තරඟයට මුහුන දීමට කැමති නැත | - තරඟය සොයා යයි |
| - සම්පත් උපරිම ප්‍රයෝජන නොගනී | - උපරිම ප්‍රයෝජන ගනී |
| - ගැටලු ගතානුගතිකව විසදයි | - ගටලු නිර්මාණශීලිව විසදයි |

(ල.02)

4. 1. ව්‍යාපාර ව්‍යවසායකයන් - සිල්ලර වෙළෙන්දන්
2. සමාජීය ව්‍යවසායකයන් - මහත්මා ගාන්ධි
3. අභ්‍යන්තර ව්‍යවසායකයින් - ඵලදායිතා සම්මාන හිමිකරගත් විදුහල්පතිවරු

5. 1. අරමුණක් පැවතිම
2. අවදානමක් පැවතිම
3. මූල්‍යම ගනුදෙනු සැලකිල්ලට ගැනීම
4. ආර්ථික කටයුත්තක් වීම
5. ගනුදෙනු අඛණ්ඩව සිදුවීම
6. ව්‍යාපාරයේ නමින් ගනුදෙනු යෙදවීම

04. - දේශිය සම්පත් උපයෝජනය කිරීම
- ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම
- නව භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කිරීම
- රැකියා අවස්ථා ජනනය කිරීම
- නිමැයුම් අපනයනය කිරීම මගින් විදේශ විනිමය ඉපයිමේ හැකියාව
- රටේ සමස්ථ නිශ්පාදනය ඉහල යාම
- ආදායම් බෙදියාමේ විෂමතාවය අඩුවීම
- ආර්ථික සංවර්ධනයට දායකවීම

2. පෞද්ගලික හිමිකාරත්වය යටතේ ස්වාධීනව මෙහෙයවනු ලබන සාපෙක්ෂව කුඩා සේවක සංඛ්‍යාවක් හා අඩු ආයෝජනයක් සහිත ව්‍යාපාර කුඩා පරිමාණ ව්‍යාපාර ලෙස හැඳින්වේ

- සාපෙක්ෂව කුඩා ප්‍රාග්ධනයක් යොදා තිබීම
- සාපෙක්ෂව සේවක සංඛ්‍යාව අඩුවීම
- ව්‍යාපාරය තනි අයිතිකරුවෙකු සතුවීම
- ව්‍යාපාරය තුල තීරණ ගැනිම පහසු වීම
- ව්‍යාපාර කටයුතු කුඩා ප්‍රදේශකයකට සීමා වීම

3. - අඩු ප්‍රාග්ධන ප්‍රමාණයකින් ආරම්භ කලහැකි වේ
- දේශීය තාක්ෂණය භාවිතයට ගත හැකිවීම
- රජයෙන් විශේෂ දිරිගැන් වීම හිමි සේවකයින් බඳවා ගැනීම හා පුහුණු කිරීම පහසු වීම
- පරිසර වෙනස්කම් වලට පහසුවෙන් අනුගත වියහැකි වීම

4. <u>අසාර්ථක වීමට හේතු</u>
- ව්‍යාපාරයේ මූල්‍ය පරිපාලනය දුර්වලවීම
- දුර්වල මානව සබඳතා
- විධිමත් සැලසුම් නොමැති වීම
- ව්‍යාපාරිකයන් ගේ දැනුම හා අද්දැකීම් මදිකම
- ව්‍යාපාරිකයා ගේ පෞද්ගලික ජීවිතය හා ව්‍යාපාර කටයුතු එකිනෙක ගැටීම

<u>සාර්ථක වීමට ගතයුතු ක්‍රියාමාර්ග</u>
- මුදල් පරිපාලනය විධිමත්ව පවත්වා ගෙනයාම
- යහපත් මානව සබඳතා පවත්වා ගෙනයාම
- නිසි සැලසුමක් මත ව්‍යාපාර කටයුතු සිදු කිරීම
- විශේෂඥයින් ගෙන් උපදෙස් හා මඟ පෙන්වීම් ලබා ගැනීම

5. - බොහෝ සාර්ථක මහා පරිමාණ ව්‍යාපාර වල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාරයක් වීම
- ව්‍යවසායකයින්ට සිය නිර්මාණශිලි හැකියාවන් පහසුවෙන් භාවිත කර නවෝද්පාදන සිදුකල හැකිවීම
- වෙළෙඳපල හිඩැස හඳුනාගෙන ව්‍යාපාර අවස්ථා සඳහා පිවිසිය හැකිවීම

(ල.2) (2 x 5 ) = 10

05. ව්‍යාපාර පරිසරය

- අභ්‍යන්තර පරිසරය
  - අයිතිකරුවන්
  - කලමනාකරුවන්
  - සේවකයන්
  - සම්පත්
- බාහිර පරිසරය
  - ආසන්න පරිසරය
  - ප්‍රජා පරිසරය
  - ආර්ථික පරිසරය
  - තාක්ෂණ පරිසරය
  - දේශපාලන හා නෛතික පරිසරය
  - ස්වභාවික පරිසරය

2. ශක්තින්
- දක්ෂ විදුහල්පතිවරයෙකු සිටීම
- පුහුණු ගුරුවරුන් සිටි
- පාසලේ භෞතික සම්පත් තිබීම
- සිසුවිනය හොඳවීම / දක්ෂ දරුවන් සිටිම

දුර්වලතා
- පාසල් පරිපාලනය දුර්වල වීම
- භෞතික සම්පත් නොමැතිවීම
- ගුරුවරුන් නිසිපරිදි කටයුතු නොකිරීම

අවස්ථා
- රජයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම
- ප්‍රභල ආදිශිෂ්‍ය සංගම් තිබීම
- දෙමාපියන් පාසලට උදවු කිරීම
- ප්‍රජාවගේ සහයෝගය පාසලට ලැබීම

තර්ජන
- අනවශ්‍ය දේශපාලන බලපෑම්
- ආදි ශිෂ්‍ය සංගමයේ අනවශ්‍ය බලපෑම්
- අවට පාසැල් වලින් ඇතිවන දැඩි තරඟය

3. - රජයේ ආර්ථික ප්‍රතිපත්ති
- අන්තර් ජාතික ගිවිසුම් වලට එලඹෙන ආකාරය
- ව්‍යාපාර සම්බන්ධයෙන් සකස් කරන නීතිරීති
- විදේශ වෙළඳාම

4. පාලනය කලහැකි
අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්, සම්පත්
පාලනය කල නොහැකි
පාරිභෝගිකයන්, සැපයුම්කරුවන්, තරඟකරුවන් රජය හා අනිකුත් බාහිර පරිසර සාධක

5. ශද්‍ර අත විශ්ලේෂණය

| | | |
|---|---|---|
| S | ශක්තීන් | අභ්‍යන්තර පරිසරයෙන් මතු වේ |
| W | දුර්වලතා | |
| O | අවස්ථා | බාහිර පරිසරයෙන් මතුවේ |
| T | තර්ජන | |

06.
- ව්‍යාපාරය සඳහා කෙතරම් කැපවිය හැකිද?
- ව්‍යාපාරයට පදනම් වන භාණ්ඩය හෝ සේවාව කුමක්ද?
- ඉලක්ක ගත පාරිභෝගිකයා කවුද
- තරඟයේ ස්වභාවය කෙබඳුද
- ඉපයීම් ප්‍රමානවත්ද
- ප්‍රාග්ධනය සපයා ගන්නේ කෙසේද
- තනිව හෝ හවුල්ව ව්‍යාපාරය ආරම්භ කරනවාද?

2.
- ස්වකීය ඉතුරුම්
- ස්වකීය වත්කම් යෙදවීම හෝ විකිණීම
- නෑදෑ හිතමිතුරන්ගෙන්
- බංකුණය සහ කල්බදු
- ගනුදෙනුකරුවන් ගේ අත්තිකාරම් ලබාගනි

3.
- පවතින භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම
- පවතින භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළෙඳපලට ඉදිරිපත් කිරීම
- නව භාණ්ඩයක් හෝ සේවාවක් පවතින වෙළඳපලට ඉදිරිපත් කිරීම
- නව භාණ්ඩයක් හෝ සේවාවක් නව වෙළඳපලට ඉදිරිපත් කිරීම

4.
1. සුවිශේෂ නව භාණ්ඩයක් හෝ සේවාවක් වීම
2. නිශ්පාදිත ප්‍රභේදනය
3. වෙළඳපල හිඩැස / අවකාශය
5. නවෝද්පාදනය

5. වෙළඳපල හිඩැස යනුවෙන් අදහස් වන්නේ වෙළඳපලෙන් පාරිභෝගිකයන්ගෙන් කොටසක් තෘප්තිමත් නොවූ අවශ්‍යතා හා වුවමනා වලින් පොලපන බවයි. මහා පරිමාණ ව්‍යවසායකන් සැඩි පාරිභෝගික සංඛ්‍යාවක් සඳහා නිශ්පාදිත ඉදිරිපත් කරන අතර සුවිශේෂ අවශ්‍යතා ඇති සුළු පාරිගෝගික කණ්ඩායම් කෙරේ සැලකිල්ලක් නොදක්වති. එබැවින් එවැනි අවස්ථා වලදි සුවිශේෂි වෙළඳපල සඳහා නව ව්‍යවසායකයන්ට අවධානය යොමු කල යුතුය.

07. 1.
- ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කල හැකි වීම
- පරිසරයේ මතුවන අවශ්‍යතා සුපරාලිය හැකිවීම
- වෙනස්වන අවශ්‍යතා හා වුවමනා වලට ප්‍රතිචාර දක්විය හැකිවීම
- තරඟකාරිත්වයට සාර්ථකව මුහුන දියහැකි විම
- තාක්ෂණය සමඟ ගැලපිය යුතුවිට
- මුහුන දෙන අවදානම අවම කරගත හකිවිම
- ව්‍යාපාරයක් බවට පරිවර්ථනය කිරීමෙන් ඉපයිමක් කල හැකිවිම
- ස්වකීය ව්‍යාපාර අදහස ආරක්ෂා කරගත හැක

2.
- විනෝදාංශ හා ලැදියා තුලින්
- පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුලින්
- වෙළඳපල සමීක්ෂ තුලින්
- පාරිභෝගික ප්‍රතිචාර තුලින්
- නිර්මාණශිලි චින්තන හැකියා තුලින්
- ජන මාධ්‍ය මගින්

- සැපයුම්කරුවන් ඇසුරෙන්
- තරඟකාරීත්වය අධ්‍යයනය කිරීම තුලින්
- අධ්‍යාපනික පාඨමාලා තුලින්
- ප්‍රදර්ශන හා අත්දැකීම් මගින්

3. - අවශ්‍ය සම්පත් සපයාගත හැකිවිම
- ඉල්ලුමක් පවතිම
- ආකර්ශණීය ඉපැයුමක් තිබිම
- තරඟකාරීත්වයට මුහුනදිය හැකි විම
- නීති රීති වලට අනුකූළ වීම

4. - වෙළඳපලක් පැවතීම
- අමු ද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව
- අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගත හැකිවීම
- රජයේ නීතිරීති ප්‍රතිපත්ති හා දිරිගැන් විම
- ව්‍යවසායකන්ගේ දැනුම පලපුරුද්ද කුසලතා
- ශ්‍රමය සපයා ගැනිමේ හැකියාව
- අවදානම
- දියත් කිරීමේ පහසුව

5. නව ව්‍යවසායකයන් බුද්ධිමය දේපල ආරක්‍ෂා කර ගැනීමට බොහෝ විට පේටන්ට් බලපත්‍රය ලබාගත යුතුය. පේටන්ට් බලපත්‍රය යනු යම් අයෙකු ගේ නව සොයා ගැනීමක් වෙනුවෙන් ලබාදෙන රජයේ සහතිකයකි. නව සොයා ගැනීමක් යනු නව නිපැයුමක් නව යන්ත්‍රයක් නව ක්‍රියාවලියි ඉහත කරුණු වල සංකලනයක් පවත්නා සොයා ගැනිමක වැඩි දියුණු කිරීමක් ලෙස අර්ථ දැක්විය හැක. මෙහි වලංගු කාලය අවුරුදු 20කි.

(ල. 2 x 5 = 10)